අශාන් පිල්ලේ ප්‍රමුඛ පෙලේ වියෝලා වාදකයෙකු හා ගුරුවරයෙකු ලෙස දකුණු යුරෝපයේ සුවිශාල පිලිගැනීමක් ලබාගත් ශ්‍රී ලංකාවේ උපත ලද බ්‍රිතාන්‍ය ජාතිකයෙකි. ලන්ඩන් හා නිව්යෝක් හි විග්මෝර්, පර්සෙල් හා කානෙගි ශාලාවල සිදුකළ වාද්‍ය කලඑලි බැසීම් හා දීර්ඝ කාලීනව ඒකල වාදකයෙකු ලෙස කටයුතු කිරීම මෙන්ම ක්‍රිස්ටෝපල් හොග්වුඩ්, ක්‍රිස්ටියන් සුකාරියාස් හා පින්චාස් සුකර්මන් හා එක්ව වාද්‍ය කණ්ඩායම් සාමාජිකයෙකු ලෙස ලබාගන්නා ලද දියුණුව තුළින් ඔහු පරිපූර්ණත්වයට පත්විය.

පූර්ව තරඟකාරීත්වය තුළින් ලබාගත් මෙම දියුණුව ඔහුට තීරණාත්මක ගෞරවයක් ලබාදීමට සමත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස ඔහුට ලෝකය පුරා පිලිගත් උත්සව වල ඒකල වාදකයෙකු හා කණ්ඩායම් වාදකයෙකු ලෙස සිය දක්ෂතා ඔප්නැංවීමට අවස්ථාව උදාවිය. මෙම උත්සව අතරින් ජර්මනියේ ශ්ලයිස්විග් හොල්ස්ටයින් උත්සවය, ස්පාඤ්ඤය, පුවෙටෝරිකෝව හා ප්‍රංශයේ කසාල්ස්, ෆින්ලන්තයේ කුක්මෝ උත්සවය, එක්සත් ජනපදයේ රවිනියා ඇස්පන්, ටැන්ගල්වුඩ් හා සරසෝටා උත්සව, ඔස්ට්‍රියාවේ සල්ස්බර්ග්, ලන්ඩනයේ ප්‍රොම්ස් හා කැනඩාවේ බැන්ෆ් යන උත්සව ප්‍රධාන තැනක් ගනී.

එසේම ඔහු ඉන්ග්‍රිසි, ස්කොට්ලන්ත හා ඇන්ඩෝරාන් හා චෙක් වාද්‍ය කණ්ඩායම්, ලිස්බන් හි ගුල්බෙන්කියන්, ෆ්‍රන්ක්ෆර්ට් හි එන්සෙම්බල් මොඩර්න් යන වාද්‍ය කණ්ඩායම් වලද ලන්ඩනයේ හා නිව්යෝක් වලද සිය දක්ෂතා ඔප්නංවන ලදි.

අශාන් පිල්ලේ ලන්ඩන් හා ලොස් ඇන්ජලීස් නගර වල මෙන්ම නිවුයෝක් හි ජුලියඩ් පාසලේ ජෝන් වයිට්, කැරන් ටට් හා ඩොනල්ඩ් මැකින්ස් වැනි සමකාලීනයන් හා සිය අධ්‍යාපනය හදාරන ලදි.

1994 - 1997 කාලය තුල ඔහු ටෙට්රිස්, රෝමයේ ජාත්‍යන්තර තරඟ, රෝයල් ඕවසීස් ලීගය, පාක් ලේන් ග්‍රෑප් හා ආටිස්ට් ඉන්ටනැෂනල් හි විශේෂ ත්‍යාග දිනාගන්නා ලදි. මොබියාස් වාද්‍ය කණ්ඩායමේ ආරම්භක සාමාජිකයෙකු වන අශාන්, ඉංග්ලිෂ් චේම්බර් ඔකෙස්ට්‍රා එන්සෙම්බල් හා සුකර්මන් පංචතූර්ය වාද්‍ය කණ්ඩායමේ වයලීන වාදකයෙකු ලෙස කටයුතු කරයි. ඔහු ඊ.එම්.අයි, බෙල්, නැක්සෝස්, ඒ.එස්.වී, වර්සෝ, කොලම්නා, අල්තාරා, ඔයෙම්ස් ක්ලැසික් හා සේජ් ලේබල් හි ඉතා එලදායී කර්තව්‍යයන් ඉටු කරන ලදි. එසේම ඔහු ඉදිරිපත් කල ඩිස්කෝ සංගීත නාමාවලියේ ඒකල වියෝලා හා පියානෝ වාදනයන්හි නිතර භාවිතා වන ස්පාඤ්ඤ ක්‍රම පිළිබඳව පරිපූර්ණ එකතුවක් ඇතුලත් වේ.

අශාන් පිල්ලේ වුල්ෆ් ගැන්ග් රිම් ගාවින් බ්‍රයර්ස් හා ක්‍රිස්ටොෆ් පෙන්ඩෙරිකී වැනි වාද්‍ය කණ්ඩායම් වල නිර්මාණ හා ලෙනාඩෝ බලාඩා, ඇන්ටන් ගාෂියා, ඒබ්‍රිල්, ජෝඩි සර්වෙලෝ සහ ෆෙල්ටා පෝලෝ යන ස්පාඤ්ඤ රචකයන්ගේ නිර්මාණ වලටද මූලික වී කටයුතු කලේය.

1995 - 2000 දී ඔහු බාසිලෝනා සිම්ෆනි ඔකෙස්ට්‍රාවේ වියෝලා උප ප්‍රධාන විදුහල්පති ලෙසද කොන්සවේටරි සුපීරියර් හා බාසිලෝනාවේ ලිසියෝ කොන්සවේටරි හි වියෝලා පිළිබඳ මහාචාර්යවරයෙකු ලෙසද මැඩ්රිඩ් හි අල්ෆොන්සෝ එක්ස් සරසවියේ බාහිර මහාචාර්යවරයෙකු ලෙස කටයුතු කලේය. ඔහු ලෝකය පුරා විශයානුබද්ධ උසස් අධ්‍යාපනය සපයන ලද ඇදුරෙකු ලෙද පිදුම් ලබයි.